*සැ. යු.* — මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

2011.08.26 දින පළ වූ අංක 1,721 දරන *ගැසට් පත්‍රයේ* I-II (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,722 - 2011 සැප්තැම්බර් මස 02 වැනි සිකුරාදා - 2011.09.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1096 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - ජයවික්‍රම පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2011 ජූනි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ලේඛන ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත, 2011 ජූනි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත, 2011 අගෝස්තු මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 සැප්තැම්බර් මස 09 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අගෝස්තු මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

## කුරුවිට ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය/126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය, පාලනය කිරීම හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2011 අගෝස්තු මස 01 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

### ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය, පාලනය හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය, පාලනය හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

2. මින් මතු කිසිම තැනැත්තෙකු විසින් යම් වීදියකට, පාරකට, ඇලකට හෝ අහසට පෙනෙන සේ කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට හෝ එසේ කිරීමට සැලැස්වීමට, ඒ සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද අවසරපත්‍රයක් යටතේ මිස කරනු නොලැබිය යුතුය.

3. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක්ම පහත දේවලින් සමන්විත විය යුතුය :-

(අ) ලේකම්වරයාට යොමු කළ ලිඛිත ඉල්ලුම් පත්‍රය ;

(ආ) දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන නිර්මිතයේ පිහිටීමට සාපේක්ෂව 1: 1000 පරිමාවට නොඅඩු පරිමාණයකින් අඳිනු ලබන භූමි සැලැස්ම ;

(ඇ) 1:1000 නොඅඩු පරිමාවට අඳින ලද එම නිර්මිතයේ රූ සටහනක් ;

(ඈ) එම සැලැස්මේ, රූප සටහනේ හෝ පිරිවිතරයෙහි මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වනු පිණිස කරනු ලබන සංශෝධන කිසිවක් වේනොත් ඒ සංශෝධන ;

(ඉ) ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමේ වර්ණ සියල්ලම යොදා කුඩා පරිමාවකට යොදා අඳින ලද ඒ දැන්වීමේ පිටපතක් ;

(ඊ) යාබද වීදිවලට සහ ප්‍රධාන භූමි සලකුණුවලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමෙහි පිහිටීම දැක්වෙන සැලැස්මක් ;

(උ) ප්‍රචාරක දැන්වීම්/නාම පුවරු ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය දීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවට අවශ්‍ය විය හැකි :-

(i) ප්‍රචාරක දැන්වීම හෝ පුවරුව සවිකරන ස්ථානයේ, භූමියේ අයිතිකරුගෙන් කැමැත්ත ලබාගත් ලිපිය ;

(ii) මාර්ග රක්ෂිතයක් නම් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගත් අවසරය ;

(iii) අධිවේගී මාර්ගවල නාම පුවරු/ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූදර්ශන අංශයෙන් ලබාගත් අනුමැතිය.

4. ඉහත දෙවැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන කවර හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ අවසරපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලීමක්ම දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයට යටත් පිරිසෙයින් දින හතකට කලින් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

5. ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද සැලසුම් වලට, රූප සටහන්වලට සහ පිරිවිතරවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා කිසිම පුවරුවක්, බිත්ති පුවරුවක්, දැන්වීම් පුවරුවක් හෝ වෙනත් යම් නිර්මිතයක් ඉදිකිරීමට සැලැස්වීම නොකළ යුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක මෙහි 1 වැනි උපලේඛනයේ දැක්වෙන බදු මුදල් ගෙවන තෙක් ඉල්ලුම්කරුට අවසරපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසරපත්‍රයක් ලබන සෑම අවසරපත්‍රලාභියෙකුම මෙහි දෙවැනි උපලේඛනයේ සභාව විසින් නිශ්චය කොට දක්වන ස්ථානවල මිස වෙනත් ස්ථානවල දැන්වීම් ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

8. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් තැනැත්තෙකුට අවසරපත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවක, අවසරපත්‍රලාභියා විසින් ප්‍රදර්ශනය කරනු ලබන සෑම ප්‍රචාරක දැන්වීමකටම එම අවසරපත්‍රයේ යොමු අංකය හා අවසරපත්‍රලාභියාගේ නම ඇතුළත් කරන ලෙස ප්‍රාදේශීය සභාව විසින් ඒ තැනැත්තාට නියම කළ හැකිය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවේ 1 වැනි උපලේඛනයේ ගාස්තු පහත 'අ' සිට 'ඊ' දක්වා වූ ව්‍යවස්ථාවල සඳහන් වූ ප්‍රචාරක දැන්වීමක් හෝ ගුවන් නාම පුවරු හෝ නොවන අවස්ථාවක අදාළ නොවන්නේ ය.

(අ) ලබන ශුද්ධ මුදල් ප්‍රමාණය පුණ්‍ය කටයුතු සඳහා යොදවන යම් ප්‍රසංගයකට අදාළ දැන්වීමක් ;

(ආ) කිසියම් ප්‍රසංගයක් පවත්වනු ලබන ස්ථානයේ ඒ ප්‍රසංගයට අදාළ ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ;

(ඇ) ආගමික, දේශපාලනික හෝ මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක් ;

(ඈ) සෙ. මී. 30 x 15 නොඉක්මවන ගෘහ නාම පුවරු ;

(ඉ) වෘත්තීය කටයුතු සඳහා යොදා ගනු ලබන ප්‍රමාණයෙන් වර්ග මීටර් 0.093 නොඉක්මවන නාම පුවරුවක් ;

(ඊ) වෙළඳ කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරන වාහනයක එම වෙළඳ කටයුත්තේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය දැක්වෙන සහ අයිතිකරුගේ නම, ලිපිනය, දුරකථන හෝ ටෙලෙක්ස් අංකය ආදිය දැක්වෙන ප්‍රචාරක දැන්වීමක්.

10. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ, ව්‍යාපාරික ස්ථානයක, ව්‍යාපාර නාමය, ලිපිනය, ලියාපදිංචි අංකය, දුරකථන අංකය හෝ ටෙලෙක්ස් අංකය ආදිය දැක්වීමට භාවිතා කරන බිත්ති පුවරුවක, දැන්වීම් පුවරුවක හෝ වෙනත් යම් නිර්මිතයක ඉහත කරුණුවලට අමතරව ඇතුළත් කොට ඇති භාණ්ඩයක හෝ සේවාවක වෙළඳ නාමය, සන්නම් හා රූප සටහන් අඩංගු කොටස් සඳහා ව්‍යාපාරයේ අයිතිකරු, බදුකරු හෝ දැන්වීම්කරු නියමිත ගාස්තුව ගෙවා ප්‍රාදේශීය සභාවෙන් අවසරපත්‍රයක් ලබා ගත යුතුය.

11. (i) කිසිම තැනැත්තෙකු විසින් යම් වීදියක, පාරක හෝ අඩි පාරක රිය මඟට උඩින් හෝ නෙරා සිටින ආකාරයකට ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම ; හෝ

(ii) පොළොවේ සිට මීටර් 12 ක් ඉක්මවන උසකින් ඇති යම් පුවරුවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම ; හෝ

(iii) කිසියම් වීදියක හෝ මහ පාරකට මුහුණලා යාව පිහිටි ගොඩනැගිල්ලෙහි මුහුණතෙහි හෝ වෙළඳ ශාලා නාම පුවරුවක හෝ ඒ ගොඩනැගිල්ලෙහි මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගින් යුත් ප්‍රචාරක දැන්වීමක් සවිකොට නැතහොත් එල්ලා තැබීම ; හෝ

(iv) ගුවන් නාම පුවරුවක ස්වභාවයේ ප්‍රචාරක දැන්වීමක් ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබා නොගෙන යම් ආකාරයකට තැනීම නොකළ යුතුය.

12. කිසිම තැනැත්තෙකු විසින් පෞද්ගලික හෝ පොදු ගොඩනැගිල්ලක, පොදු පූජනීය ස්ථානයක, පොදු උද්‍යානයක හෝ යම් පාළමක හෝ පාරක් හරහා ඇති මගී පාළමක, දුරකථන හෝ විදුලි රැහැන් කණුවක, පැති බැම්මක, දුරකට පෙනෙන වේල්ලක, අමුණක, බෝක්කුවක, පර්වතයක ඉවුරක හෝ ගසක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

13. සභාවේ යෝජනා සම්මතයක නිශ්චය කොට දැක්වෙන ගැසට් පත්‍රයේ යථා පරිදි පළ කරන ලද යම් ප්‍රදේශයක කිසිම ප්‍රචාරක දැන්වීමක් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ ආකාරයට තනා හෝ ඉදි කර ඇති දැන්වීම් පුවරුවක් හෝ නාම පුවරුවක් වන්නේ නම් මිස ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

14. කිසිම තැනැත්තෙකු විසින් කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් වීදියක හෝ පාරක -

(i) යම් පුවරුවක, ආධාරයක හෝ රාමුවක ප්‍රදර්ශිත යම් ප්‍රචාරක දැන්වීමක් ගෙන යාම හෝ ගෙන යාමට සැළැස්වීම ; හෝ

(ii) යම් පුවරුවක, ආධාරයක හෝ රාමුවක ප්‍රදර්ශිත යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට හෝ හඳුන්වාදීමේ කාර්යය සඳහා ගුවන් විදුලි යන්ත්‍රයක්, ග්‍රැමෆෝනයක්, සංගීත භාණ්ඩයක්, සීනුවක් හෝ වෙනත් උපකරණයක් පාවිච්චි කිරීම නොකළ යුතුය.

15. (i) යම් ප්‍රචාරක දැන්වීමක අවලක්ෂණ හෝ පිළිකුල් සහගත සහ මහජන සදාචාරයට හා මහජන සාමයට හානිකර යමක් නිරූපණය වන අවස්ථාවක හෝ පරිසර හිතකාමී නොවන ප්ලාස්ටික් හෝ පොලිතීන් ද්‍රව්‍යයකින් තනා ප්‍රදර්ශනය කරන අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් ලිඛිත නිවේදනයක් මගින් ඒ නිවේදනයේ නිශ්චය කොට දැක්වෙන යම් කාලයක් ඇතුළත ඒ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන කිරීම නතර කරන ලෙස ඒ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කරන තැනැත්තාට නියම කළ හැකිය.

(ii) මේ අතුරු ව්‍යවස්ථාවේ 01 වැනි ඡේදය යටතේ නිවේදනයක් භාරදෙනු ලැබූ කවර තැනැත්තෙකු විසින් එම නිවේදනයේ නිශ්චය කොට දැක්වෙන කාලසීමාවක් ඇතුළත එහි නියම කොට ඇති ආකාරය අනුව ක්‍රියා කළ යුතුය.

16. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම පිණිස ප්‍රයෝජනයට ගන්නා යම් පුවරුවක අයිතිකරු විසින් හෝ බදුකරු විසින් -

(i) ඒ පුවරුව නිසි අළුත් වැඩියාවෙන් යුතුව සහ තැනැත්තන්ගේ ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් නිසි නඩත්තුවකින් යුතුව පවත්වා ගෙන යා යුතුය.

(ii) ඒ පුවරුව ඉදිරිපස ප්‍රකටව පෙනෙන තැනක පැහැදිළිව කියවිය හැකි අකුරින් දැන්වීම්කරුගේ /බදුකරුගේ/ අයිතිකරුගේ නම, ලිපිනය සහ දුරකථන අංකය ප්‍රදර්ශනය කළ යුතුය.

17. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නියමිත බදු මුදල් ගෙවා ඇති බව පෙන්වීමට යම් ප්‍රචාරක දැන්වීමක කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් ඇතුළත් කර ඇති යම් ලාංඡනයක්, සළකුණක්, අක්ෂරයක්, වචනයක් හෝ ඉලක්කමක් කිසිම තැනැත්තෙකු විසින් විරූප කිරීම හෝ කරවීම නොකළ යුතුය.

18. (i) කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් නොමැතිව හෝ එකී අවසර පත්‍රයේ සඳහන් කර ඇති කොන්දේසිවලට හෝ නියමයන්ට පටහැනි හෝ යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනයට ප්‍රයත්නයක් ආරම්භ කර හෝ පවත්වාගෙන යන හෝ යළි ආරම්භ කර ඇති හෝ සම්පූර්ණ කර ඇති හෝ අවස්ථාවක මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ඇති වෙනත් ප්‍රතිකර්මයට අමතරව ප්‍රාදේශීය සභාව විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන ප්‍රයත්නය ක්‍රියාත්මක කරන හෝ ක්‍රියාත්මක කළ හෝ ක්‍රියාත්මක කර වූ දවස් හතකට නොඅඩු වන්නා වූ ද දිනයක දී හෝ ඊට ප්‍රථම-

(අ) ඒ ප්‍රචාරක දැන්වීම් කටයුතු නතර කරන ලෙස ; හෝ

(ආ) ඒ ප්‍රචාරක දැන්වීම කඩා දමන ලෙස හෝ, මකා දමන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ ඉවත් කරන ලෙස හෝ එහි හිමිකරුට හෝ බදුකරුට හෝ නියම කළ හැක.

(ii) ඉහත 18(1) ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාර කරනු ලැබූ තැනැත්තෙකු විසින් ඒ දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන කාලය ඇතුළත හෝ කාලය දීර්ඝ කරවා ගැනීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයක් මත ප්‍රාදේශීය සභාව විසින් දීර්ඝ කරන ලද යම් කාල සීමාවක් ඇතුළත හෝ ඒ නියමයෙහි නියම කර ඇති පරිදි කටයුතු කළ යුතුය.

(iii) (අ) ඉහත 18 (1) ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාර ගනු ලැබූ තැනැත්තෙකු විසින් එහි සඳහන් කාලසීමාව ඇතුළත හෝ ප්‍රාදේශීය සභාව විසින් දීර්ඝ කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් ඇතුළත එකී දැන්වීමේ නියමයන්ට අනුව ක්‍රියා කිරීම පැහැර හැරියහොත් අවස්ථාවෝචිත පරිදි ඒ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය නතර කිරීමට, කඩා දැමීමට, වෙනස් කිරීමට, මකා දැමීමට හෝ ඉවත් කිරීමට ප්‍රාදේශීය සභාවට බලය දෙන ආඥාවක් නිකුත් කරන ලෙස ප්‍රාදේශීය සභාව විසින් නිසි බලය සහිත මහෙස්ත්‍රාත් අධිකරණයකින් ඉල්ලීමක් කළ හැක.

(ආ) ඉහත 18 (1) වැනි ව්‍යවස්ථාව යටතේ වන දැන්වීම අනුව ක්‍රියා කිරීමට ඒ තැනැත්තා භාර ගතහොත් ඒ තැනැත්තාට එසේ කටයුතු කිරීමට අවස්ථාවක් සැලසීම සුදුසු යැයි අදහස් කෙරේ නම් ඒ ආඥාව ක්‍රියාත්මක කිරීම මාසයක් නොඉක්මවන කාලයකට කල් තැබිය හැකිය.

19. මේ අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම උල්ලංඝනය කිරීමක්ම සම්බන්ධයෙන් නිසි බලය සහිත මහෙස්ත්‍රාත් අධිකරණයකින් වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තෙකුම රුපියල් හත්සිය පණහකට (රු.750) නොඅඩු දඩයකට යටත් විය යුතු අතර, එම උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක ඒ උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකු විසින් යවන ලද ලිඛිත දැන්වීමක් භාර ගනු ලැබීමෙන් පසුව ඒ වරද කරගෙන යන සෑම දිනයක් ම වෙනුවෙන් ම රුපියල් දෙසිය පණහක් (රු. 250) නොඉක්මවන අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබීමකට යටත්විය යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු සඳහා පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "සභාව" යන්නෙන් කුරුවිට ප්‍රාදේශීය සභාව ද, 'සභාපතිවරයා' යන්නෙන්, කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, 'ලේකම්වරයා' යන්නෙන් කුරුවිට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද, 'බලය පවරන නිලධාරියෙකු' යන්නෙන් කුරුවිට ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරි හෝ ආදායම් පරිපාලක හෝ වෙනත් නිලධාරියෙකු ද, 'ප්‍රචාරක දැන්වීමක්' යන්නෙන් ප්ලාස්ටික්, ඉටිරෙදි, ලෝහ වර්ග, කාඩ්බෝඩ් හෝ කඩදාසි, දැව වර්ග, රෙදි හා වෙනත් ද්‍රව්‍ය උපයෝගී කර ගෙන භාණ්ඩයක් හෝ සේවාවක් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට සංකේත, රූප සටහන්, අක්ෂර හෝ චිත්‍ර භාවිතා කරගෙන ඉදිරිපත් කරන පණිවිඩයක් ද, 'අවසරපත්‍රලාභියා, දැන්වීම්කරු' යන්නෙන් ප්‍රචාරක කටයුතු භාර ආයතනය හෝ භාණ්ඩය හෝ සේවාව නිපදවන ආයතනය අදහස් වේ.

21. මෙහි අර්ථ නිරූපනයක් සම්බන්ධයෙන් යම් පරස්පරතාවයක් ඇති වුවහොත් සිංහල අර්ථය බලපැවැත්විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව වරින්වර සංශෝධනය කර ගැනීමේ බලය ප්‍රාදේශීය සභාව සතු වේ.

*1 වැනි උපලේඛනය*

| | | *මාසයකට හෝ ඉන් කොටසක් සඳහා වර්ග අඩි 01 කට රු. ශ.* | *වර්ෂයකට වර්ග අඩි 01 කට රු. ශ.* |
|---|---|---|---|
| (i) | වේදිකා නාට්‍යයක් හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් නොවන වෙනත් ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට | 25 0 | 30 0 |
| (ii) | වේදිකා නාට්‍යයක් හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට | 3 50 | 30 0 |
| (iii) | වේදිකා නාට්‍යයක් හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට | 5 50 | 35 0 |
| (iv) | වේදිකා නාට්‍යයක් හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳ ප්‍රචාරක දැන්වීමක් නොවන්නා වූ ද, ලණු ආධාරයෙන් ප්‍රදර්ශනය කර ඇත්තාවූ ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට | 25 0 | 30 0 |
| (v) | වේදිකා නාට්‍යයක් හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට | 5 50 | 30 0 |
| (vi) | යම් රිය පෙට්ටියක, රිය කාරයක හෝ කරත්තයක සවිකර ඇති විට හෝ ප්‍රචාරක දැන්වීමක් මතුපිට පින්තාරු කර යම් රිය පෙට්ටියක, රිය කාරයක හෝ කරත්තයක ජංගම ප්‍රචාරක පුවරුවක් හෝ දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට | 10 0 | 45 0 |
| (vii) | වේදිකා නාට්‍යයක් හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳ ප්‍රචාරක දැන්වීමක් නොවන, ආධාරක මත පිහිටුවා ඇති ගුවන් ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට | 5 50 | 30 0 |

(මෙයට අමතරව රජය විසින් වරින් වර පනවනු ලබන බදු ගෙවීමට ද දැන්වීම්කරු විසින් කටයුතු කළ යුතුය.).

*2 වැනි උපලේඛනය*

(i) කුරුවිට ප්‍රධාන පාළම අසල දැන්වීම් පුවරුව,
(ii) මහජන ක්‍රීඩාපිටිය අසළ දැන්වීම් පුවරුව,
(iii) කුරුවිට බස් නැවතුමට ඇතුළු වන ස්ථානයේ පිහිටුවා ඇති දැන්වීම් පුවරුව.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.* - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2011**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 2011.09.02 | සිකුරාදා | 2011.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.09 | සිකුරාදා | 2011.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.16 | සිකුරාදා | 2011.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.23 | සිකුරාදා | 2011.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.30 | සිකුරාදා | 2011.09.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2011.10.07 | සිකුරාදා | 2011.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.14 | සිකුරාදා | 2011.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.21 | සිකුරාදා | 2011.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.28 | සිකුරාදා | 2011.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2011.11.04 | සිකුරාදා | 2011.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.11.11 | සිකුරාදා | 2011.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.11.18 | සිකුරාදා | 2011.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.11.25 | සිකුරාදා | 2011.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.